සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 198-212
ISSN 1800-1459

# කුඩා වැව් ප්‍රතිසංස්කරණයේ දී ප්‍රමුඛතාව හඳුනා ගැනීම සඳහා සහභාගිත්ව ග්‍රාමීය පිවිසුම් ක්‍රමවේද භාවිතය (ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්)

**කේ. පී. එල්. නිශාන්ත පටබැඳි**

සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, බෙලිහුල්ඔය.

## සාරසංක්ෂේපය

ශ්‍රී ලංකාව තුළ ප්‍රතිසංස්කරණය කළ කුඩා වැව් 15,000 ක් පමණ දක්නට ලැබේ. විවිධ මානව අවශ්‍යතා රාශියක් සඳහා කුඩා වැව යොදා ගැනේ. කුඩා වැව් 250 කින් සමන්විත ගල්ගමුව ප්‍රා.ලේ. කොට්ඨාසය ඇසුරෙන් මෙම අධ්‍යයනය සිදුකර ඇත. පර්යේෂණය මගින් උත්සාහ ගෙන ඇත්තේ යුගල සැසඳුම් න්‍යාසය නම් සහභාගිත්ව ග්‍රාමීය පිවිසුම් මෙවලම මගින් කුඩා වැව් ප්‍රත්සංස්කරණයේ දී ප්‍රමුඛතාව දියයුතු අංශ අනාවරණය කර ගැනීම යි. ඒ සඳහා ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි පසුගිය වසර 15 තුළ ප්‍රතිසංස්කරණයට ලක්වූ වැව් 77 ක් අතරින් වැව් 12 ක් ස්තෘත සසම්භාවී නියැදි තේරීම යටතේ තෝරාගෙන ඇත. කන්න රැස්වීම් අවසානයයේ දී යුගල සැසඳුම් න්‍යාසය නම් සහභාගිත්ව ග්‍රාමීය පිවිසුම් (PRA) මෙවලම භාවිතයෙන් ප්‍රමුඛතාවන් විමසීමට ලක්කර ඇත. කුඩා වැවක් යනු හෙක්ටයාර 80 ට අඩු කුඹුරු ප්‍රමාණයකට ජලය සපයන වැවකි (හෙ 1 = අක්කර 2.47). පසුගිය කාලයේ දී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, සමෘද්ධි අධිකාරිය, ගම නැගුම ව්‍යාපෘතිය ඇතුළු විවිධ රාජ්‍ය නොවන සංවිධාන කුඩා වැව් ප්‍රතිසංස්කරණයට දායක වී ඇත. නමුත් මෙහි දී වැවක ප්‍රතිසංස්කරණය කළ යුත්තේ කුමන අංශ ද යන්න පිළිබඳ ව ගොවීන්ගේ මතය විමසීමක් සිදුව නැත. වැවක ප්‍රතිසංස්කරණය කළයුතු අංශ වශයෙන් වැව හාරා පස් ඉවත් කිරීම, වැවේ ශාක වැස්ම ඉවත් කිරීම, වැව් බැම්ම, සොරොව්ව, ප්‍රධාන ඇල සහ සෙසු වාරි ඇල , පිටවාන ප්‍රතිසංස්කරණය සහ වැව් තාවුළු සංරක්ෂණය සඳහන් කළ හැකි ය. සියලු ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර ඇත්තේ ආයතනවල නිලධාරීන්ගේ අදහස අනුව ය. දේශපාලනික ව ජන අවධානය දිනාගත හැකි ක්‍රමය තෝරාගෙන ඇත. බොහෝ විට කර ඇත්තේ වැව හාරා පස් ඉවත් කිරීමයි. යුගල සැසඳුම් න්‍යාස 12ක් විශ්ලේෂණය මගින් ලැබී ඇති ප්‍රතිඵල අනුව සමස්ථයක් වශයෙන් ප්‍රමුඛ අවශ්‍යතාව වන්නේ වැව හාරා පස් ඉවත් කිරීම වුවත් හැම වැවකම ප්‍රමුඛ අවශ්‍යතාව එය නොවේ. උදාහරණයක් වශයෙන් මැදවච්චිය වැවේ ප්‍රමුඛ අවශ්‍යතාව වූයේ තාවුල්ල සංරක්ෂණය යි. බුල්නෑව සහ ඉහළ පළුකැන්දෑව වැව්වල ප්‍රමුඛ අවශ්‍යතාව වූයේ වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීමයි. පහළ පළුකැන්දෑව වැවට අවශ්‍ය වූයේ වැව් බැම්ම ප්‍රතිසංස්කරණයයි. ගොවීන් පෙන්වා දෙන අවශ්‍යතාවන් අනුව ප්‍රතිසංස්කරණය කිරීම මගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගත හැකි අතර නඩත්තුව සඳහා ඔවුන්ගේ සක්‍රීය දායකත්වය ද ලබා ගත හැකි ය.

කේන්ද්‍රීය වචන :- කුඩාවැව, ප්‍රතිසංස්කරණය, සහභාගිත්වය, න්‍යාසය, ප්‍රමුඛතාව

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී විශේෂයෙන් වී වගාවේදී කුඩා වැව් කැපී පෙනේ. ඊට හේතුව වන්නේ ශ්‍රී ලංකාවේ වියලි කලාපය පුරා කුඩා වැව් 30,000 ක් පමණ දක්නට ලැබීමත් (Tennakoon, 2002)

වියළි කලාපීය ජන ජීවිතය ඒ වටා හැඩ ගැසී තිබීමත් ය. හුදෙක් වී වගාවට ජලය ලබා ගැනීමට ලඝු නොවී අති විශේෂිත වූ කටයුතු රාශියක් කර ගැනීම සඳහා කුඩා වැව යොදා ගැනේ. වැව යනු ගම යන්නත් ගම යනු වැව යන්නත් යන අදහස සත්‍යයක් වන තරමට ගම හා වැව එකිනෙකට බැඳී පවතී. සියවස් හතරකට ආසන්න කාලයක් බටහිර ජාතීන්ගේ ආක්‍රමණවලට නතුවී තිබීම හේතුවෙන් විනාශමුඛයට ගිය කුඩා වැව් නැවත ප්‍රතිසංස්කරණය ඇරඹුනේ 1948 දී නිදහස ලැබීමෙන් අනතුරුව ය. ගත වූ දශක 6ක කාලය තුළ කුඩා වැව් 15000 කට අධික ප්‍රමාණයක් වරින් වර ප්‍රතිසංස්කරණයට ලක් වී ඇත. මෙම අධ්‍යයනය මගින් උත්සාහ ගෙන ඇත්තේ කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ දී ප්‍රමුඛතාව දියයුතු අංග කවරේදැයි සහභාගිත්ව ගැමි ප්‍රවේශයේ භාවිත මෙවලමක් වන යුගල සැසඳුම් න්‍යාසය මගින් අනාවරණය කර ගැනීම යි.

කෘෂි කටයුතු සහ නිවාස අවශ්‍යතා ඇතුළු විවිධ වූ මානව අවශ්‍යතා සඳහා ජලය ලබා ගැනීමට මෝසම් වැසි මගින් ලැබෙන ජලය රැස්කර ගන්නා මූලාශ්‍රයක් ලෙස කුඩා වැව් භාවිත කෙරේ. ස්වාභාවික ජල මාර්ග හරහා වේල්ලක් බැඳීම මගින් ජල මාර්ගය අහුරා කුඩා වැව් තනාගෙන ඇත. එපමණක් නොව වැසි ජලය රැස්වන ස්ථාන තව දුරටත් හාරා එම පස්වලින් බැම්ම සකස් කොට තනා ගත් කුඩා වැව්ද ඇත. කෙටිකාලීන සූක්ෂම වගාවන්ට ජලය සපයන කුඩා වැව් දිගුකාලීන හෝ විස්තෘත වගාවන් සඳහා ජලය සැපයීමට යොදා ගැනීම දුෂ්කරය. ඊට හේතුව වන්නේ කාලීනව ලැබෙන වැසි ජලය රැස්කර ගන්නා මූලාශ්‍රයයක් වශයෙන් කුඩා වැව් යොදා ගැනීමයි (Darmasena, 1994; Madduma Bandara, 1985; Tennakoon, 2004).

වාපී තාක්ෂණය ශ්‍රී ලංකාවට පමණක් ආවේණික ක්‍රමයක් නොවේ. ආසියානු රටවල් වන මියෙන්මාරය, තායිලන්තය, කාම්බෝජය සහ ඉන්දියාව වැනි රටවල ද වැව් තාක්ෂණය දක්නට ඇත (Panabokke and Shakthiwadiwel, 2002). ඉන්දියාවේ තමිල්නාඩු, ආන්ද්‍රප්‍රදේශ් හා කර්නාටක යන ප්‍රාන්තවල වැව් භාවිතයෙන් වී වගාව සඳහා ජල සම්පාදනය සිදුවේ. ෆාමර්ට අනුව (Famer, 1957) ශ්‍රී ලංකාවේ සහ දකුණු ඉන්දියාවේ වාපී කෘෂිකර්මයෙහි සමානතාවන් දක්නට ලැබේ. ඊට හේතුව වන්නේ ප්‍රදේශ දෙකේ ම දේශගුණික තත්වයන්හි සමානතාවන් දක්නට ලැබීමයි. තමිල්නාඩු ප්‍රාන්තයෙහි වැව් 3900 ක් දක්නට ලැබේ. තමිල්නාඩුවේ ඇති වැව් ද ශ්‍රී ලංකාවේ වැව් ලෙසින් ම අංශ දෙකකට බෙදා දැක්විය හැකි ය. එනම් ක්‍රමවත් වැව් සහ ක්‍රමවත් නොවන වැව් වශයෙනි. ක්‍රමවත් වැව්වලට ප්‍රධාන ගංගා සහ ජලාශ මගින් ජලය සම්පාදනය කෙරේ. ඊට අමතර ව සිය පෝෂක ප්‍රදේශවලින් ද (Catchment Areas) ජලය ලැබේ. නමුත් ක්‍රමානුකූල නොවන වැව් සඳහා ජලය ලැබෙනුයේ එහි පෝෂක ප්‍රදේශයට ලැබෙන වර්ෂා ජලයෙන් පමණි. ශ්‍රී ලංකාවේ ද කුඩා වැව් වැඩි ප්‍රතිශතයක් අයත් වන්නේ ඉහත දෙවන වර්ගයට ය. එනම් එම කුඩා වැව් ද පෝෂණය ලබන්නේ සිය පෝෂක ප්‍රදේශයට ලැබෙන වර්ෂාපතනයත් මතුපිට ගලා යන ජලයත් මගින් වීමයි. ශ්‍රී ලංකාවේ කුඩා වැව් ආශ්‍රිත ව කෙරෙන ගොවිතැනෙහි අස්වැන්න තීරණය වන්නේ වැව් පෝෂක ප්‍රදේශයේ පාංශු ව්‍යුහයේ තෙතමන තත්වයන් අනුව සහ ලැබෙන වර්ෂාපතනයෙහි කාලීන සබඳතාවන් අනුව ය (Somasiri, 1979).

## වැව් ප්‍රතිසංස්කරණය හා එහි වැදගත්කම

නිකොලස් හා පරණවිතානට අනුව (2004:) වැව් ප්‍රතිසංස්කරණය කිරීම මුලින් ම ආරම්භ වනුයේ ක්‍රි. වර්ෂ 777 - 797 කාලය තුළ රජ කළ මිහිඳු රජුගේ කාලයේදී බව පුරා වෘත්තවල සඳහන් වේ. ඔහු විසින් ප්‍රතිසංස්කරණයට ලක්කර ඇත්තේ කලා වැවයි. ඉන් පසුව වරින් වර විවිධ පුද්ගලයන් විසින් වැව් ප්‍රතිසංස්කරණය සිදුකොට ඇතත් ඉතිහාසගත තොරතුරු අනුව වාර්තාගත වැව් සංඛ්‍යාවක් ප්‍රතිසංස්කරණය කර ඇත්තේ ක්‍රි. වර්ෂ 1070 - 1110 දක්වා රජකළ පළමුවන විජයබාහු රජතුමා විසිනි. නමුත් කුඩා වැව් ප්‍රතිසංස්කරණයේ ස්වභාවය ඊට වෙනස් ය. මුල් කාලයේදී කුඩා වැව් ප්‍රතිසංස්කරණය කර ඇත්තේ ගම් වැසියන් විසිනි.

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වීමෙන් අනතුරු ව කිසිදු ප්‍රතිසංස්කරණයකට ලක් නොවූ වැව් නැවත ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි අවධානය යොමු කළේ හෙන්රි වෝඩ් සහ ග්‍රෙගරි යන ආණ්ඩුකාරවරුන් විසිනි. කෙසේ වෙතත් 1832 න් පසුව ඉඩම් හිමිකම් රටාව වෙනස්වීමත් සමග ම කුඩා වැව් නඩත්තු හා ප්‍රතිසංස්කරණ සඳහා බාධා ඇති විය. නිදහසින් පසුව අගමැතිවරුන් වූ ඩී. ඇස්. සේනානායක හා එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක යන මහත්වරුන් විසින් ශ්‍රී ලංකාවේ පැවති පැරණි වාරි සංස්කෘතිය නැවත පනගැන්වීමට උත්සාහ ගෙන ඇත. වර්තමානයේ ප්‍රධාන වශයෙන් කුඩා වැව් නඩත්තු හා ප්‍රතිසංස්කරණ කටයුතු සිදුවනුයේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධානත්වයෙනි. අසූව දශකයේ ආරම්භයේ සිට අනුරාධපුර වියළි කලාප කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ විවිධ රාජ්‍ය නොවන සන්විධාන එක්ව කුඩා වැව් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර ඇත (Aheeyar, 2005).

කුඩා වැව් ද ඇතුළු ව ඕනෑ ම වැවක් ගත් විට එය කෘෂිකර්මාන්තය සඳහා ජලය සපයන මාධ්‍යයක් වශයෙන් පමණක් ක්‍රියාත්මක වී නැත. එමගින් පාරිසරික සංතුලනය හා අලංකාරය ඇති කිරීම, භූ ගත ජලය සංවර්ධනය කිරීම, පාංශු ජල් සංරක්ෂණය, සතුන් සඳහා පානීය ජලය සැපයීම, ජලජ සත්ව හා ශාක වර්ධනය සඳහා මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීම, වියළි කාලයේදී ප්‍රයෝජනය සඳහා වැසි ජලය ගබඩා කර ගැනීම, රොන්මඩ තැන්පත් කර ගැනීම ඇතුළු බහුවිධ ක්‍රියාකාරකම් සඳහා ප්‍රයෝජනවත් වේ. එබැවින් වැව් ප්‍රතිසංස්කරණය නොකිරීම හා නඩත්තු නොකිරීම නිසා පාරිසරික ක්‍රියාකාරිත්වය කෙරෙහි අනපේක්ෂිත බාධා ඇති කරයි. මධ්‍යම පරිසර අධිකාරියේ 1994 වාර්තාවට අනුව වැව්වල ජලය සීමාවීම නිසා විශේෂයෙන් යල කන්නයේදී විවිධ බලපෑම් ඇති වී තිබේ. ඒවා නම්

- මිරිදිය මත්ස්‍ය ගහනය හා විවිධත්වය කෙරෙහි සෘණාත්මක වෙනස්වීම් ඇති කිරීම
- සංචාරක පක්ෂීන් ඇතුළු සියලු පක්ෂි ප්‍රජාව කෙරෙහි සෘණාත්මක බලපෑම් ඇති කිරීම
- සත්ව පාලන කටයුතු, ගෘහස්ත අපද්‍රව්‍ය බැහැර කිරීම හා රසායනික පොහොර මගින් ඇති කරන අහිතකර බලපෑම තීව්‍ර කිරීම

වර්ෂ 2002 ආරම්භයේ සිට ප්‍රජාව විසින් කළමනාකරණය කරනු ලැබූ සුළු වාරි කර්මාන්ත ව්‍යාපෘතිය (MIS) වියලි කලාපයේ දිස්ත්‍රික්ක 17 ක් තුළ එක්සත්

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 198-212
ISSN 1800-1459

ජාතීන්ගේ ලෝක ආහාර ව්‍යාපෘතිය (WFP), ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව (DAD) සහ රාජ්‍ය නොවන සංවිධාන කීපයක් ඒකාබද්ධ ව ක්‍රියාත්මක කර ඇත. මෙම ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිවල බහුවිධ පාරිසරික හා ආර්ථික අරමුණු පැවතිණ. ලෝක බැංකුවේ ආධාර ඇති ව ශ්‍රී ලංකා රජය මගින් ග්‍රාමීය වාරි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (VIRP) යටතේ වියළි කලාපීය දිස්ත්‍රික් 14 ක් තුළ කුඩා වැව් සහ අමුණු 1200 ක් ප්‍රතිසංස්කරණය කර ඇත. මෙහිදී නිවැරදි ජල කළමනාකරණය, අස්වනු වර්ධනය කිරීම සහ පාංශු සංරක්ෂණය අරමුණු වශයෙන් පැවතී ඇත.

## ප්‍රධාන කුඩා වැව් ප්‍රතිසංස්කරණ විධික්‍රම

- වැව හාරා පස් ඉවත් කිරීම
- වැව් බැම්ම ප්‍රතිසංස්කරණය
- වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම
- සොරොව්ව ප්‍රතිසංස්කරණය කිරීම
- පිටවාන ප්‍රතිසංස්කරණය කිරීම
- වාරි ඇල ප්‍රතිසංස්කරණය කිරීම
- වැව් තාවුල්ල සංරක්ෂණය කිරීම

## පර්යේෂණ ගැටලුව

කුඩා වැව් ප්‍රතිසංස්කරණයේ දී ප්‍රමුඛතාව හඳුනා ගැනීම සඳහා සහභාගීත්ව ග්‍රාමීය පිවිසුම් ක්‍රමවේද භාවිතය කෙතරම් දුරට සාර්ථක ද?

## පර්යේෂණ අරමුණු

### ප්‍රධාන අරමුණ

කුඩා වැව් ප්‍රතිසංස්කරණයේදී ප්‍රමුඛතාව ලබා දිය යුත්තේ වැව් ක්ෂෙත්‍රයේ කුමන අංගයට ද යන්න හඳුනා ගැනීම

### අධ්‍යයන ප්‍රදේශය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරාගෙන ඇත. උක්ත ප්‍රදේශය ශ්‍රී ලංකාවේ වියලි කලාපයට අයත් වන තැනිතලා පහත් බිම් හා රැලි බිම් ප්‍රදේශයකි.



1 සිතියම - ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටීම

මූලාශ්‍රය - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගල්ගමුව

ISSN 1800-1459

අධ්‍යයනයට යොදාගත් කුඩා වැව් පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාස පහත සඳහන් පරිදි ය.

| | | | |
|---|---|---|---|
| ඉහලගම | - 11 | දිවුල්ලැව | - 23 |
| ඉහලපළුකැන්දෑව | - 19 | කුරුන්දන්කුලම | - 24 |
| පහලපළුකැන්දෑව | - 20 | බුල්නෑව | - 27 |
| මොන්නන්කුලම | - 21 | | |

අධ්‍යයන ප්‍රදේශය අඩු වර්ෂාපතනයක් ලැබෙන එමෙන් ම ග්‍රාමීය දිළිඳුකම ඉහළ ප්‍රදේශයක් වන නමුත් ප්‍රදේශය පුරා පැතිරුණ කුඩා වැව් රාශියකින් (කුඩා වැව් 250) සමන්විත ප්‍රදේශයකි. පානබොක්කේට (2002) අනුව කුරුණෑගල උතුරු ප්‍රදේශයේ වර්ග සැතපුම් 1.5 ක ප්‍රදේශයකට කුඩා වැවක් බැගින් ඇත. එබැවින් මෙවන් අධ්‍යයනයක් සඳහා සුදුසුම ප්‍රදේශයක් වශයෙන් ගල්ගමුව හඳුනා ගැනිණ. අධ්‍යයන ප්‍රදේශයේ නිරපේක්ෂ පිහිටීම වන්නේ උතුරු අක්ෂාංශ $7^{0}$ 50" සහ $8^{0}$ 15" අතරත් නැගෙනහිර දේශාංශ $79^{0}$ 57" ත් $80^{0}$45" අතර ප්‍රදේශය යි. අධ්‍යයන ප්‍රදේශය කුඩා ගම් 182 කින්ද ග්‍රාම නිලධාරී බල ප්‍රදේශ 62 කින්ද සමන්විත ය.

## පර්යේෂණයේ වැදගත්කම

වඩාත් තිරසාර ක්‍රමවේදය මගින් කුඩාවැව් ප්‍රතිසංස්කරණය කළ විට අපේක්ෂිත ඉලක්ක කරා ළඟා විය හැකිවීම.

## පර්යේෂණ ක්‍රමවේදය

### දත්ත රැස් කිරීම

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත මෙන් ම ද්විතීයික දත්ත ද එකසේ භාවිත කර ඇත. ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා මූලික වශයෙන් සහභාගිත්ව ග්‍රාමීය ප්‍රවේශය යොදාගත් අතර ක්ෂෙත්‍ර නිරීක්ෂණ ද භාවිත කෙරිණ. ස්තෘත සසම්භාවී ලෙස තෝරාගත් වැව් ගම්මාන දොළහක් තුළ ක්‍රියාත්මක වන ගොවි සංවිධාන රැස්වීම් 12 ක් සඳහා රැස්වූ අවස්ථා PRA ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කර ඇත (Chambers, 1994).

වගුව 1: වැව් නියැදිය තෝරාගත් ආකාරය (I පියවර)

| ගොවීන් සංඛ්‍යාව → / පෝශිත ප්‍රදේශය (අක්කර) ↓ | 0 - 59 | 60 - 119 | 120 - 189 | 190 - 249 | එකතුව |
|---|---|---|---|---|---|
| 0 – 35 | 55 | 3 | 1 | 0 | 59 |
| 36 – 71 | 10 | 3 | 0 | 0 | 13 |
| 72 – 107 | 0 | 3 | 0 | 1 | 04 |
| 108 – 143 | 0 | 1 | 0 | 0 | 01 |
| එකතුව | 65 | 10 | 01 | 01 | 77 |

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 198-212
ISSN 1800-1459

වගුව 2: **වැව් නියැදිය තෝරාගත් ආකාරය(II පියවර)**

| ගොවීන් සංඛ්‍යාව → <br> පෝශිත ප්‍රදේශය (අක්කර) ↓ | 0 - 59 | 60 - 119 | 120 - 189 | 190 - 249 | එකතුව |
|---|---|---|---|---|---|
| 0 – 35 | 55/77 ×12 = 8 | 0 | 0 | 0 | 08 |
| 36 – 71 | 10/77× 12 = 2 | 3/77 × 12 = 1 | 0 | 0 | 03 |
| 72 – 107 | 0 | 3/77 × 12 = 1 | 0 | 0 | 01 |
| 108 – 143 | 0 | 0 | 0 | 0 | 00 |
| එකතුව | 10 | 02 | 00 | 00 | 12 |

වගුව 3: **සසම්භාවී වගුව භාවිතයෙන් තෝරා ගත් වැව් සහ PRA සඳහා තෝරා ගත් ගොවි පවුල් සංඛ්‍යාව**

| අනු අංක | සසම්භාවී අංක | වැවේ නම | ගොවි පවුල් සංඛ්‍යාව | වැව මගින් පෝශිත ප්‍රදේශය (අක්කර) | PRA සඳහා සහභාගි වූ ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | 118 | පහළ පුලංචිය වැව | 58 | 08 | 46 |
| 02 | 87 | ඉහළගම වැව | 13 | 08 | 12 |
| 03 | 41 | පහළ කෝන් වැව | 31 | 34 | 28 |
| 04 | 05 | ඉහළ පළුකැන්දෑව වැව | 40 | 12 | 36 |
| 05 | 11 | ඔට්ටුකුලම වැව | 18 | 18 | 15 |
| 06 | 83 | දිවුල්ලෑව වැව | 49 | 30 | 38 |
| 07 | 16 | කුරුන්දන්කුලම වැව | 35 | 35 | 30 |
| 08 | 10 | මොන්නන්කුලම වැව | 46 | 27 | 38 |
| 09 | 02 | පහළ පළුකැන්දෑව වැව | 35 | 35 | 28 |
| 10 | 29 | බුල්නෑව වැව | 59 | 54 | 40 |
| 11 | 90 | මදවච්චිය වැව | 105 | 71 | 47 |
| 12 | 93 | මහගල්කඩවල වැව | 90 | 75 | 42 |
| | | එකතුව | 579 | | 400 |

## දත්ත විශ්ලේෂණය

දත්ත විශ්ලේෂණය සඳහා භාවිත කර අත්තේ සහභාගිත්ව ග්‍රාමීය ප්‍රවෙශයෙහි විශ්ලේෂණය මෙවලමක් වන යුගල සැසඳුම් න්‍යාස ක්‍රමයයි. එහිදී එක් තැනකට රැස්කර ගන්නා ගොවීන් සමග අදාළ වැවෙහි ප්‍රතිසංස්කරණයන් පිළිබඳ ව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරනු ලැබේ. අනතුරු ව ප්‍රතිසංස්කරණය විය යුතු අංග පෙළගැස්වීමක් සිදුකරන අතර එක් වරකට යුගලය බැගින් ගෙන සාකච්ඡාවට ලක් කෙරෙන අතර වඩාත් වැඩි ප්‍රමුඛතාවක් දිය යුතු ප්‍රතිසංස්කරණ අංගය

*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 198-212*
*ISSN 1800-1459*

ඒකමතික ව තෝරා ගැනීම සිදුවේ (Chambers, 1994). ඒ අනුව වඩාත් වැඩි වාර ගණනක් ප්‍රමුඛතාව හිමිකර ගන්නා අංගය සඳහා ප්‍රතිසංස්කරණයේදී ප්‍රමුඛතාව ලබා දෙනු ඇත.

## සාකච්ඡාව

තෝරා ගත් වැව් පදනම් කරගෙන යුගල සැසඳුම් න්‍යාස ගොඩනගා ඇති ආකාරය මොන්නන්කුළම වැව ආශ්‍රයෙන් පහත න්‍යාසය 1 මගින් දක්වා ඇත. ඒ අනුව අධ්‍යයනයට යොදාගත් වැව් 12 ට අදාළ සියලු න්‍යාසවල දත්ත එක් වගුවකට ඇතුළත් කර අවසන් විශ්ලේෂණය සිදුකර ඇත.

**න්‍යාසය 1 වැව් ප්‍රතිසංස්කරණ ප්‍රමුඛතාව බැලීම සඳහා යුගල සැසඳුම් න්‍යාසය (මොන්නන්කුළම වැව)**

| | | 1 වැව හාරා පස් ඉවත් කිරීම | 2 වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | 3 වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | 4 සොරොව්ව ප්‍රතිසංස්කරණය | 5 පිටවාන ප්‍රතිසංස්කරණය | 6 වාරි ඇල ප්‍රතිසංස්කරණය | 7 වැව් තාවුල්ල සංරක්ෂණය | ලකුණු | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැව් හාරා පස් ඉවත් කිරීම | * | 1 | 1 | 1 | 1 | 1 | 1 | 6 | 1 |
| 2 | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | | * | 3 | 4 | 5 | 6 | 2 | 1 | 4 |
| 3 | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | | | * | 3 | 3 | 3 | 3 | 4 | 2 |
| 4 | සොරොව්ව ප්‍රතිසංස්කරණය | | | | * | 4 | 4 | 4 | 3 | 3 |
| 5 | පිටවාන ප්‍රතිසංස්කරණය | | | | | * | 6 | 5 | 1 | 4 |
| 6 | වාරි ඇල ප්‍රතිසංස්කරණය | | | | | | * | 6 | 1 | 4 |
| 7 | වැව් තාවුල්ල සංරක්ෂණය | | | | | | | * | 0 | 5 |

මෙහිදී වඩාත් ම ප්‍රමුඛතාව දිය යුතු අංගය සඳහා අංක 1 ලබා දෙන අතර දෙවනුව වැදගත් වන අංගයට අංක 2 ලබා දී තිබේ. ඒ අකාරයට අංක 1 සිට 7 දක්වා අගයන් ප්‍රමුඛතාව අනුව ලබා දී ඇත. ඒ අනුව ලැබුණු දත්ත තරාගත කිරීමෙන් ප්‍රතිසංස්කරණ අවශ්‍යතාව අත්‍යාවශ්‍ය බවේ අනුපිළිවෙලට සකස් කළ හැකි විය. අවසන් ප්‍රතිඵලය න්‍යාසය 2 මගින් දක්වා තිබේ. ඒ අනුව අනාගත කුඩා වැව් ප්‍රතිසංස්කරණ පහත සඳහන් ප්‍රමුඛතාව අනුව සිදු කිරීමට පියවර ගත හැකි ව ඇත.

1. වැව හාරා පස් ඉවත් කිරීම
2. වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම
3. වාරි ඇල ප්‍රතිසංස්කරණය
4. වැව් බැම්ම ප්‍රතිසංස්කරණය
5. සොරොව්ව ප්‍රතිසංස්කරණය
6. පිටවාන ප්‍රතිසංස්කරණය
7. වැව් තාවුල්ල සංරක්ෂණය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 198-212
ISSN 1800-1459

**න්‍යාසය 2 කුඩා වැව් ප්‍රතිසංස්කරණ විධික්‍රම යුගල සැසඳුම් න්‍යාසය මගින් විශ්ලේෂණය කිරීම**

| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|---|---|
| | | වැව හාරා පස් ඉවත් කිරීම | වැව බැම්ම ප්‍රතිසංස්කරණය | වැවේ වැඩී ඇති ශාක වැඩීම ඉවත් කිරීම | සොරොව්ව ප්‍රතිසංස්කරණය | සවාන ප්‍රතිසංස්කරණය | වාරි ඇල ප්‍රතිසංස්කරණය | වැව් තාවුල්ල සංරක්ෂණය |
| 1 | මොන්නන්කුළම | 1 | 4 | 2 | 3 | 4 | 4 | 5 |
| 2 | ඔට්ටුකුළම | 1 | 4 | 2 | 3 | 4 | 4 | 5 |
| 3 | මදවච්චිය | 3 | 5 | 2 | 4 | 6 | 2 | 1 |
| 4 | බුල්නෑව | 2 | 3 | 1 | 3 | 4 | 3 | 3 |
| 5 | පහල කෝන්වැව | 1 | 5 | 3 | 6 | 2 | 4 | 7 |
| 6 | දිවුල්ලෑව | 1 | 3 | 1 | 3 | 3 | 1 | 2 |
| 7 | කුරුන්දන්කුළම | 1 | 7 | 2 | 5 | 6 | 3 | 4 |
| 8 | ඉහල පළුකැන්දෑව | 3 | 2 | 4 | 6 | 1 | 5 | 7 |
| 9 | පහල පළුකැන්දෑව | 3 | 1 | 2 | 5 | 6 | 4 | 7 |
| 10 | පහල පුලංචිය | 1 | 3 | 2 | 4 | 5 | 3 | 4 |
| 11 | මහගල්කඩවල | 1 | 2 | 3 | 5 | 6 | 4 | 7 |
| 12 | ඉහලගම | 1 | 3 | 2 | 3 | 4 | 3 | 5 |
| | මුළු ලකුණු | 19 | 42 | 26 | 50 | 51 | 40 | 57 |
| | ප්‍රමුඛතාව | 1 | 4 | 2 | 5 | 6 | 3 | 7 |

අතීත කුඩා වැව් ප්‍රතිසංස්කරණ අත්දැකීම් අනුව සිදුවී ඇත්තේ නිළධාරීන් විසින් වඩාත් ජනප්‍රිය ක්‍රමවේදය වැව් ප්‍රතිසංස්කරණය සඳහා යොදා ගැනීමයි. බොහෝ අවස්ථාවල දී සිදුවී ඇත්තේ වැව හාරා පස් ඉවත් කිරීමයි. නමුත් ඇතැම් වැව්වල පස් හාරා පස් ඉවත් කිරීම නිසා වෙනත් ගැටලු වර්ධනය වී ඇත. ඇතැම් වැව්වල පස් හාරා වැව තුළ ම ගොඩගසා ඇත (උදා : මහගල්කඩවල වැව) එහිදී සිදුවන්නේ වර්ෂාවෙන් පසුව නැවත එම පස් ගොඩ වැවට ම දියවී යෑමයි. ගැටලුවලට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ උක්ත වැවේ ප්‍රතිසංස්කරණ සඳහා වැව හාරා පස් ඉවත් කිරීම අවශ්‍යතාවක් ව නො පැවතීම යි. වැව හාරා පස් ඉවත් කිරීම මගින් ගොවි ජනතාවගේ අවශ්‍යතා ඉටුවේ යැයි සිතීම හා ඔවුන්ගේ සිත් දිනාගත හැකි යැයි සිතීම සත්‍ය තත්වය නොවේ. යුගල සැසඳුම් න්‍යාස මගින් ලැබුණු දත්ත විමර්ශනයෙන් හා විශ්ලේෂණයෙන් පසුව ඇතැම් වැව්වල ප්‍රමුඛ අවශ්‍යතාව වැව හාරා පස් ඉවත් කිරීම නොවන බව තහවුරු විය. උදාහරණයක් වශයෙන් මදවච්චිය වැව් ප්‍රජාව විසින් දක්වන ලද කරුණු අනුව ඔවුන්ගේ වැවේ ප්‍රමුඛ ප්‍රතිසංස්කරණ අවශ්‍යතාව නම් වැව් තාවුල්ල සංරක්ෂණය කිරීමයි. බොහෝ විට කුඩා වැවක වැව් ඉහත්තාව එක්කෝ රජයට අයිතිවේ නැතහොත් ඊට ඉහත ඇති වැවක ප්‍රජාවට අයිතිවේ. කාට අයිති වුව ද වැවක දිගු කාලීන පැවැත්ම උදෙසා වැව් ඉහත්තාව හා තාවුල්ල සංරක්ෂණය කළ යුතු වේ. නමුත් සිදුවන්නේ ඉහත්තාව පමණක් නොව වැව් තාවුල්ලද වගාවන්ට යොදා ගැනීමයි. මෙම තත්වය කුඩා වැවක ධරනීය පැවැත්මට හානිකර ය. මේ අනතුරට මුහුණ දී ඇති මදවච්චිය වැවේ ප්‍රජාවට වැව් තාවුල්ල සංරක්ෂණය කිරීම ප්‍රතිසංස්කරණයේ ප්‍රමුඛ අවශ්‍යතාව බවට පෙනී ගොස් ඇති නිසා ඒ බව

සාමූහික ව තහවුරු කර ඇත. බුල්නෑව සහ දිවුල්ලෑව වැව් ප්‍රජාවන්ගේ සහභාගිත්ව තිරණය අනුව ඔවුන්ගේ වැව්වල ප්‍රතිසංස්කරණයක් සිදුකරන්නේ නම් කළ යුත්තේ වැවේ වර්ධනය වී ඇති ශාක වැස්ම ඉවත් කිරීම බව යුගල සැසඳුම මගින් තහවුරු කර ඇත. ඉහළ පළුකැන්දෑව වැව් ප්‍රජාවගේ සහභාගිත්ව තිරණය අනුව ප්‍රමුඛ වූයේ පිටවාන ප්‍රතිසංස්කරණය කිරීම වන අතර පහළ පළුකැන්දෑව වැව් ප්‍රජාවගේ සහභාගිත්ව තිරණය අනුව ප්‍රමුඛ වූයේ වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම යි.

## නිගමනය

වැව් ප්‍රතිසංස්කරණයේ දී යොදාගන්නා ප්‍රධාන අවශ්‍යතා හතක් ඇත. වඩාත් ප්‍රමුඛ අවශ්‍යතාව වැව හාරා පස් ඉවත් කිරීම වුව ද එසේ නොවන අවස්ථා ද ඇත. බොහෝ වගකිව යුතු ආයතන වැව් ප්‍රතිසංස්කරණවලදී ගොවි ජනතාවගේ අදහස් විමසීමට උනන්දුවක් දක්වා නැත. සහභාගිත්ව ප්‍රවේශයන් මගින් ප්‍රමුඛතාවන් හඳුනාගෙන ප්‍රතිසංස්කරණ කටයුතු කිරීම මගින් වී වගාවේ සංවර්ධනය ඇතුළු ව බොහෝ අංශවල ප්‍රගතියක් අත්කර ගත හැකි ය. වැව් ප්‍රතිසංස්කරණවලින් අනතුරු ව නඩත්තු කටයුතු සඳහා පෙර පැවති රාජකාරී ක්‍රමයට සමාන ක්‍රමයක් අනුගමනය කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල අත්කර ගත හැකි වනු ඇත. ගොවීන්ගේ අදහස්, විවේචන, යෝජනා සහ අත්දැකීම් කෙරෙහි දැඩි අවධානය යොමු කිරීම ප්‍රතිසංස්කරණවලදී අතිශය ප්‍රතිඵලදායක වනු ඇත. එමෙන් ම වැව් පරිසරය සංරක්ෂණයේ වැදගත්කම සහ අඛන්ඩ නඩත්තුවේ වැදගත්කම පිළිබඳ ව ගොවි ජනතාව දැනුවත් කිරීම ද අත්‍යවශ්‍ය කරුණක් ව පවතී.

## පරිශීලිත මූලාශ්‍රය

Aheeyar, M.M.M. (2005) "Renovation of Minor Tanks - Problems and Prospects', *Economic Review*, Peaples Bank, Colombo, Sri Lanka, 17-20pp.

Chambers, R. (1994a) *The origins and practice of participatory rural appraisal, World Development*, 22(7),.Instittute of Development Studies, UK. pp.953-969

___________ (1994b) "Participatory rural appraisal (PRA): Analysis of experience" *World Development,* 22(9), Instittute of Development Studies, UK. pp.1253-1268

Dharmasena.P.B. (1994) *Conservation farming practices for small reservoir watersheds: a case study from Sri Lanka.* Agro-forestry systems. Vol. 28: pp203-212.

Farmer, B.H., (1957) *Pioneer Peasant Colonization in Ceylon*, Oxford.

Madduma Bandara, C.M. (1985) *Catcment Ecosystems and Village Tank Cascades in the Dry Zone of Sri Lanka*, In Lundqvist, U. Lohm and M. Falkanmark (ed.) Stratergies for River Basin development. Germany: J. Reidel Publishing Company. Pp. 99-103.

ISSN 1800-1459

Nicolas C.W. & Paranawithana S. (1961) *A Concise Histry of Ceylon*, Translating and editing by S.B Hettiarachchi in 2004, Saman Publications, Gangodawila Nugegoda. pp.256-274

Panabokke, C.R., Sakthiwadivel, R. and Weerasinghe A.D., (2002) *Small Tanks in Sri Lanka, Evaluation, Present Status and Issues*, International Water Management Institute, Colombo, pp.73

Somasiri, S., (1979) *Village Tank as an Agricultural Resource in the Dry Zone of Sri Lanka*. Tropical Agriculturist, 135: pp33 – 46.

Tennakoon, M.A.U. (2002) "Small Tanks Cascades as Development Units in the Dry Zone in Sri Lanka", *Economic Review*, Peaples Bank, Colombo, Sri Lanka, pp 21-29.

______________ (2004) "Tanks are not Mono Functional they are Multifunctional", *Proceedings of a Symposium*, Hector Kobbekaduwa Agrarian Research and Training Institute, Colombo, pp1-7.

## ඇමුණුම - අධ්‍යයනයට යොදාගත් වැව ආශ්‍රිත යුගල සැසඳුම් න්‍යාසයන්

## වැව් ප්‍රතිසංස්කරණ ප්‍රමුඛතාව බැලීම සඳහා යුගල සැසඳුම් න්‍යාසය (ඔට්ටුකුළම වැව)

න්‍යාසය 3

| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වැව හාරා පස් ඉවත් කිරීම | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | සොරොව්ව ප්‍රතිසංස්කරණය | පිටවාන ප්‍රතිසංස්කරණය | වාරි ඇල ප්‍රතිසංස්කරණය | වැව් කාවුල්ල සංරක්ෂණය | ලකුණු | ස්ථානය |
| 1 | වැව හාරා පස් ඉවත් කිරීම | * | 1 | 1 | 1 | 1 | 1 | 1 | 6 | 1 |
| 2 | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | | * | 3 | 4 | 5 | 6 | 2 | 1 | 4 |
| 3 | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | | | * | 3 | 3 | 3 | 3 | 4 | 2 |
| 4 | සොරොව්ව ප්‍රතිසංස්කරණය | | | | * | 4 | 4 | 4 | 3 | 3 |
| 5 | පිටවාන ප්‍රතිසංස්කරණය | | | | | * | 6 | 5 | 1 | 4 |
| 6 | වාරි ඇල ප්‍රතිසංස්කරණය | | | | | | * | 6 | 1 | 4 |

ISSN 1800-1459

## වැව් ප්‍රතිසංස්කරණ ප්‍රමුඛතාව බැලීම සඳහා යුගල සැසඳුම් න්‍යාසය (මැදවච්චිය වැව)

න්‍යාසය 4

| | | 1 වැව හාරා පස් ඉවත් කිරීම | 2 වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | 3 වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | 4 සොරොව්ව ප්‍රතිසංස්කරණය | 5 පිටවාන ප්‍රතිසංස්කරණය | 6 වැව් ඇල ප්‍රතිසංස්කරණය | 7 වැව් තාවුල්ල සංරක්ෂණය | ලකුණු | ස්ථානය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැව හාරා පස් ඉවත් කිරීම | * | 1 | 2 | 1 | 1 | 6 | 7 | 3 | 3 |
| 2 | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | | * | 3 | 4 | 2 | 6 | 7 | 1 | 5 |
| 3 | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | | | * | 3 | 3 | 3 | 7 | 4 | 2 |
| 4 | සොරොව්ව ප්‍රතිසංස්කරණය | | | | * | 4 | 6 | 7 | 2 | 4 |
| 5 | පිටවාන ප්‍රතිසංස්කරණය | | | | | * | 6 | 7 | 0 | 6 |
| 6 | වැව් ඇල ප්‍රතිසංස්කරණය | | | | | | * | 7 | 4 | 2 |
| 7 | වැව් තාවුල්ල සංරක්ෂණය | | | | | | | * | 5 | 1 |

## වැව් ප්‍රතිසංස්කරණ ප්‍රමුඛතාව බැලීම සඳහා යුගල සැසඳුම් න්‍යාසය (බුල්නෑව වැව)

න්‍යාසය 5

| | | 1 වැව හාරා පස් ඉවත් කිරීම | 2 වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | 3 වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | 4 සොරොව්ව ප්‍රතිසංස්කරණය | 5 පිටවාන ප්‍රතිසංස්කරණය | 6 වැව් ඇල ප්‍රතිසංස්කරණය | 7 වැව් තාවුල්ල සංරක්ෂණය | ලකුණු | ස්ථානය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැව හාරා පස් ඉවත් කිරීම | * | 1 | 3 | 1 | 1 | 1 | 1 | 5 | 2 |
| 2 | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | | * | 3 | 4 | 2 | 2 | 2 | 3 | 3 |
| 3 | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | | | * | 3 | 3 | 3 | 3 | 6 | 1 |
| 4 | සොරොව්ව ප්‍රතිසංස්කරණය | | | | * | 4 | 6 | 4 | 3 | 3 |
| 5 | පිටවාන ප්‍රතිසංස්කරණය | | | | | * | 6 | 5 | 1 | 4 |
| 6 | වැව් ඇල ප්‍රතිසංස්කරණය | | | | | | * | 6 | 3 | 3 |
| 7 | වැව් තාවුල්ල සංරක්ෂණය | | | | | | | * | 0 | 5 |

ISSN 1800-1459

## වැව් ප්‍රතිසංස්කරණ ප්‍රමුඛතාව බැලීම සඳහා යුගල සැසඳුම් න්‍යාසය (පහළකෝන් වැව)

න්‍යාසය 6

| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වැව හාරා පස් ඉවත් කිරීම | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | සොරොව්ව ප්‍රතිසංස්කරණය | පිටවාන ප්‍රතිසංස්කරණය | වාරි ඇල ප්‍රතිසංස්කරණය | වැව් තාවුල්ල සංරක්ෂණය | ලකුණු | ස්ථානය |
| 1 | වැව හාරා පස් ඉවත් කිරීම | * | 1 | 1 | 1 | 1 | 1 | 1 | 6 | 1 |
| 2 | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | | * | 3 | 2 | 5 | 6 | 2 | 2 | 5 |
| 3 | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | | | * | 3 | 5 | 3 | 3 | 4 | 3 |
| 4 | සොරොව්ව ප්‍රතිසංස්කරණය | | | | * | 5 | 6 | 4 | 1 | 6 |
| 5 | පිටවාන ප්‍රතිසංස්කරණය | | | | | * | 5 | 5 | 5 | 2 |
| 6 | වාරි ඇල ප්‍රතිසංස්කරණය | | | | | | * | 6 | 3 | 4 |
| 7 | වැව් තාවුල්ල සංරක්ෂණය | | | | | | | * | 0 | 7 |

## වැව් ප්‍රතිසංස්කරණ ප්‍රමුඛතාව බැලීම සඳහා යුගල සැසඳුම් න්‍යාසය (දිවුල්ලෑව වැව)

න්‍යාසය 7

| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වැව හාරා පස් ඉවත් කිරීම | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | සොරොව්ව ප්‍රතිසංස්කරණය | පිටවාන ප්‍රතිසංස්කරණය | වාරි ඇල ප්‍රතිසංස්කරණය | වැව් තාවුල්ල සංරක්ෂණය | ලකුණු | ස්ථානය |
| 1 | වැව හාරා පස් ඉවත් කිරීම | * | 1 | 1 | 1 | 1 | 6 | 1 | 5 | 1 |
| 2 | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | | * | 3 | 2 | 5 | 6 | 7 | 1 | 3 |
| 3 | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | | | * | 3 | 3 | 3 | 3 | 5 | 1 |
| 4 | සොරොව්ව ප්‍රතිසංස්කරණය | | | | * | 4 | 6 | 7 | 1 | 3 |
| 5 | පිටවාන ප්‍රතිසංස්කරණය | | | | | * | 6 | 7 | 1 | 3 |
| 6 | වාරි ඇල ප්‍රතිසංස්කරණය | | | | | | * | 6 | 5 | 1 |
| 7 | වැව් තාවුල්ල සංරක්ෂණය | | | | | | | * | 3 | 2 |

*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 198-212*
*ISSN 1800-1459*

## වැව් ප්‍රතිසංස්කරණ ප්‍රමුඛතාව බැලීම සඳහා යුගල සැසඳුම් න්‍යාසය (කුරුන්දන්කුලම වැව)

න්‍යාසය 8

| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වැව හාරා පස් ඉවත් කිරීම | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | සොරොව්ව ප්‍රතිසංස්කරණය | පිටවාන ප්‍රතිසංස්කරණය | වාරි ඇල ප්‍රතිසංස්කරණය | වැව් තාවුල්ල සංරක්ෂණය | ලකුණු | ස්ථානය |
| 1 | වැව හාරා පස් ඉවත් කිරීම | * | 1 | 1 | 1 | 1 | 1 | 1 | 6 | 1 |
| 2 | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | | * | 3 | 4 | 5 | 6 | 7 | 0 | 7 |
| 3 | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | | | * | 3 | 3 | 3 | 3 | 5 | 2 |
| 4 | සොරොව්ව ප්‍රතිසංස්කරණය | | | | * | 4 | 6 | 7 | 2 | 5 |
| 5 | පිටවාන ප්‍රතිසංස්කරණය | | | | | * | 6 | 7 | 1 | 6 |
| 6 | වාරි ඇල ප්‍රතිසංස්කරණය | | | | | | * | 6 | 4 | 3 |
| 7 | වැව් තාවුල්ල සංරක්ෂණය | | | | | | | * | 3 | 4 |

## වැව් ප්‍රතිසංස්කරණ ප්‍රමුඛතාව බැලීම සඳහා යුගල සැසඳුම් න්‍යාසය (ඉහළ පළුකැන්දැව වැව)

න්‍යාසය 9

| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වැව හාරා පස් ඉවත් කිරීම | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | සොරොව්ව ප්‍රතිසංස්කරණය | පිටවාන ප්‍රතිසංස්කරණය | වාරි ඇල ප්‍රතිසංස්කරණය | වැව් තාවුල්ල සංරක්ෂණය | ලකුණු | ස්ථානය |
| 1 | වැව හාරා පස් ඉවත් කිරීම | * | 2 | 1 | 1 | 5 | 1 | 1 | 4 | 3 |
| 2 | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | | * | 2 | 2 | 5 | 2 | 2 | 5 | 2 |
| 3 | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | | | * | 3 | 5 | 3 | 3 | 3 | 4 |
| 4 | සොරොව්ව ප්‍රතිසංස්කරණය | | | | * | 5 | 6 | 4 | 1 | 6 |
| 5 | පිටවාන ප්‍රතිසංස්කරණය | | | | | * | 5 | 5 | 6 | 1 |
| 6 | වාරි ඇල ප්‍රතිසංස්කරණය | | | | | | * | 6 | 2 | 5 |
| 7 | වැව් තාවුල්ල සංරක්ෂණය | | | | | | | * | 0 | 7 |

## වැව් ප්‍රතිසංස්කරණ ප්‍රමුඛතාව බැලීම සඳහා යුගල සැසඳුම් න්‍යාසය (පහළ පළුකැන්දෑව වැව)

න්‍යාසය 10

| | | 1 වැව හාරා සෑස් ඉවත් කිරීම | 2 වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | 3 වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | 4 සොරොව්ව ප්‍රතිසංස්කරණය | 5 පිටවාන ප්‍රතිසංස්කරණය | 6 වාරි ඇළ ප්‍රතිසංස්කරණය | 7 වැව් තාවුල්ල සංරක්ෂණය | ලකුණු | ස්ථානය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැව හාරා සෑස් ඉවත් කිරීම | * | 2 | 3 | 1 | 1 | 1 | 1 | 4 | 3 |
| 2 | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | | * | 2 | 2 | 2 | 2 | 2 | 6 | 1 |
| 3 | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | | | * | 3 | 3 | 3 | 3 | 5 | 2 |
| 4 | සොරොව්ව ප්‍රතිසංස්කරණය | | | | * | 4 | 6 | 4 | 2 | 5 |
| 5 | පිටවාන ප්‍රතිසංස්කරණය | | | | | * | 6 | 5 | 1 | 6 |
| 6 | වාරි ඇල ප්‍රතිසංස්කරණය | | | | | | * | 6 | 3 | 4 |
| 7 | වැව් තාවුල්ල සංරක්ෂණය | | | | | | | * | 0 | 7 |

## වැව් ප්‍රතිසංස්කරණ ප්‍රමුඛතාව බැලීම සඳහා යුගල සැසඳුම් න්‍යාසය (පහළ පූලංචිය වැව)

න්‍යාසය 11

| | | 1 වැව හාරා සෑස් ඉවත් කිරීම | 2 වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | 3 වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | 4 සොරොව්ව ප්‍රතිසංස්කරණය | 5 පිටවාන ප්‍රතිසංස්කරණය | 6 වාරි ඇළ ප්‍රතිසංස්කරණය | 7 වැව් තාවුල්ල සංරක්ෂණය | ලකුණු | ස්ථානය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැව හාරා සෑස් ඉවත් කිරීම | * | 1 | 1 | 1 | 1 | 1 | 1 | 6 | 1 |
| 2 | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | | * | 3 | 4 | 2 | 2 | 2 | 3 | 3 |
| 3 | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | | | * | 3 | 3 | 3 | 3 | 5 | 2 |
| 4 | සොරොව්ව ප්‍රතිසංස්කරණය | | | | * | 4 | 6 | 7 | 2 | 4 |
| 5 | පිටවාන ප්‍රතිසංස්කරණය | | | | | * | 6 | 7 | 0 | 5 |
| 6 | වාරි ඇල ප්‍රතිසංස්කරණය | | | | | | * | 6 | 3 | 3 |
| 7 | වැව් තාවුල්ල සංරක්ෂණය | | | | | | | * | 2 | 4 |

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 198-212
ISSN 1800-1459

## වැව් ප්‍රතිසංස්කරණ ප්‍රමුඛතාව බැලීම සඳහා යුගල සැසඳුම් න්‍යාසය (මහගල්කඩවල වැව)

න්‍යාසය 12

| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වැව හාරා පස් ඉවත් කිරීම | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | සොරොව්ව ප්‍රතිසංස්කරණය | පිටවාන ප්‍රතිසංස්කරණය | වාරි ඇල ප්‍රතිසංස්කරණය | වැව් තාවුල්ල සංරක්ෂණය | ලකුණු | ස්ථානය |
| 1 | වැව හාරා පස් ඉවත් කිරීම | * | 1 | 1 | 1 | 1 | 1 | 1 | 6 | 1 |
| 2 | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | | * | 2 | 2 | 2 | 2 | 2 | 5 | 2 |
| 3 | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | | | * | 3 | 3 | 3 | 3 | 4 | 3 |
| 4 | සොරොව්ව ප්‍රතිසංස්කරණය | | | | * | 4 | 6 | 4 | 2 | 5 |
| 5 | පිටවාන ප්‍රතිසංස්කරණය | | | | | * | 6 | 5 | 1 | 6 |
| 6 | වාරි ඇල ප්‍රතිසංස්කරණය | | | | | | * | 6 | 3 | 4 |
| 7 | වැව් තාවුල්ල සංරක්ෂණය | | | | | | | * | 0 | 7 |

## වැව් ප්‍රතිසංස්කරණ ප්‍රමුඛතාව බැලීම සඳහා යුගල සැසඳුම් න්‍යාසය (ඉහළගම වැව)

න්‍යාසය 13

| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වැව හාරා පස් ඉවත් කිරීම | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | සොරොව්ව ප්‍රතිසංස්කරණය | පිටවාන ප්‍රතිසංස්කරණය | වාරි ඇල ප්‍රතිසංස්කරණය | වැව් තාවුල්ල සංරක්ෂණය | ලකුණු | ස්ථානය |
| 1 | වැව හාරා පස් ඉවත් කිරීම | * | 1 | 1 | 1 | 1 | 1 | 1 | 6 | 1 |
| 2 | වැව් බැම්ම ප්‍රතිසංස්කරණය | | * | 3 | 4 | 2 | 2 | 2 | 3 | 3 |
| 3 | වැවේ වැඩී ඇති ශාක වැස්ම ඉවත් කිරීම | | | * | 3 | 3 | 3 | 3 | 5 | 2 |
| 4 | සොරොව්ව ප්‍රතිසංස්කරණය | | | | * | 4 | 6 | 4 | 3 | 3 |
| 5. | පිටවාන ප්‍රතිසංස්කරණය | | | | | * | 6 | 5 | 1 | 4 |
| 6 | වාරි ඇල ප්‍රතිසංස්කරණය | | | | | | * | 6 | 3 | 3 |
| 7 | වැව් තාවුල්ල සංරක්ෂණය | | | | | | | * | 0 | 5 |